සියලු ම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது/ All Rights Reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

# අ.පො.ස (උ.පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2025

| ව්‍යාපාර අධ්‍යයනය I | 32 | S | I | 13 ශ්‍රේණිය | පැය දෙකයි |
|---|---|---|---|---|---|

**උපදෙස්:**

* සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න .
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
* උත්තර පත්‍රයේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* 1සිට 30තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ප්‍රශ්නය ඉදිරියෙන් ඇති තිත් ඉරි මත ලියන්න.
* ප්‍රශ්න අංක 31 සිට 50 තෙක් වූ ප්‍රශ්න වලට කෙටි පිළිතුරු අදාල තිත් ඉරි මත ලියන්න.
* සෑම ප්‍රශ්නයකටම ලකුණු දෙක බැගින් හිමිවේ.

1) ව්‍යාපාර හා බැඳුනු සාවද්‍ය ප්‍රකාශය වන්නේ,
   1. ව්‍යාපාරයක පදනම අයිතිකරුවන්ය.
   2. ව්‍යාපාරයක මූලික කර්තව්‍යය අවශ්‍යතා හා වුවමනා සපුරාලීමයි.
   3. ව්‍යාපාර සෑම විටම ආර්ථික කටයුත්තක යෙදේ.
   4. ව්‍යාපාර විසින් වුවමනා නිර්මාණය කරයි.
   5. ව්‍යාපාර අවදානම් සහගත කටයුත්තකි. (..........)

2) නිෂ්පාදනයේ අංශය අනුව ව්‍යාපාර වර්ගීකරණය හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය කුමක්ද?
   1. පතල් හා කැණීම් ප්‍රාථමික අංශයට අයත් වේ.
   2. ජලය පිරිසිදු කිරීම හා බෙදා හැරීම කර්මාන්ත අංශයට අයත් වේ.
   3. කසල කළමණාකරණය හා ප්‍රතිචක්‍රීකරණයට තෘතීයික අංශයට අයත් වේ.
   4. විදුලිය, ගෑස්, වාෂ්ප, සහ වායු සමීකරණ සැපයීම සේවා අංශයට අයත් වේ.
   5. නිමැවුම් සහ ඉදිකිරීම් ද්විතියික අංශයට අයත් වේ. (..........)

3) ව්‍යාපාර පරිසරය හා බැඳුනු සාවද්‍ය ප්‍රකාශය වන්නේ,
   1. ගනුදෙනුකරුවන් කාර්ය පරිසර සාධකයකි.
   2. ව්‍යාපාරයක පැවැත්ම තීරණය කරන අභ්‍යන්තර පරිසර සාධකය වන්නේ අයිතිකරුවන්ය.
   3. සංවිධානයක යහපත් වැඩ සංස්කෘතියක් පැවතීම ශක්තියකි.
   4. විභව අයෝජකයින්ගේ පැමිණීමට බාධා පැවතීම ව්‍යාපාරයකට තර්ජනයකි.
   5. තරඟකරුවන් ව්‍යාපාරයක විකුණුම් , වෙළඳපොල කොටස සහ ලාභදායිත්වය කෙරෙහි බලපෑම් ඇති කරයි. (..........)

4) පහත දෑ අතරින් තිරසර සංවර්ධන ඉලක්කයක් නොවන්නේ කුමක්ද?
   1. දුගීබව තුරන් කිරීම
   2. සාගින්න තුරන් කිරීම
   3. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය
   4. ගුණාත්මක අධ්‍යාපනය
   5. ප්‍රාදේශීය කාර්මිකරණය (..........)


iexamhub www.iexamhub.com Your Trusted Partner for Exam Success Past Papers Model Answers - Study Resources

5) තිරසර බව කළමණාකරණය හා බැඳුණු සාවද්‍ය ප්‍රකාශය වන්නේ,
1. තිරසර බව කෙරෙහි ඇතිකරණ අහිතකර බලපෑම කළමණාකරණය කෙරෙහි පමණක් මඟ පෙන්වයි.
2. මිනිස් ජීවිත වල ගුණාත්මකභාවය ඉහළ නැංවීමට ඉවහල් වේ.
3. ස්වභාවික සම්පත් ආරක්ෂා කිරීමට හා කළමණාකරණයට හේතු වේ.
4. ආදායම් හා ආයෝජන ඉලක්ක සපුරා ගැනීමට ඉවහල් වේ.
5. ගෝලීය තිරසර සංවර්ධනයට මඟ පෙන්වයි. (..........)

6) රාජ්‍ය ආදායම් සංයුතිය තුල වැඩිම ආදායමක් නියෝජනය වන බදු වර්ගය වන්නේ,
1. එකතු කල අගය මත බදු
2. ආදායම් බදු
3. නිෂ්පාදන බදු
4. ආනයන මත බදු
5. වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු (..........)

7) ව්‍යාපාර සංවිධාන හා බැඳුනු ලියවිලි X තීරුවේද , ඊට සම්බන්ධ තොරතුරු Y තීරුවේද දැක්වේ.

| X | Y |
|---|---|
| 1. හවුල් ව්‍යවස්ථාවලිය | A. සමාගම විසින් ඇතිකර ගත් ගිවිසුම් අනාවරණය කරයි. |
| 2. සංස්ථා ප්‍රකාශය | B. විෂය භාර අමාත්‍යවරයා විසින් රජයේ ගැසට් පත්‍රයේ පළ කරයි. |
| 3. සාංගමික ව්‍යවස්ථාවලිය | C. නෛතික පුද්ගලභාවය හිමි වේ. |
| 4. සංස්ථාපන සහතිකය | D. සියලුම සාමාජිකයන් විසින් අත්සන් කල යුතුය |
| 5. සංස්ථාපන නියෝගය | E. පරමාර්ථ අනාවරණය කරයි |

ඉහත "X" තීරුවේ අනුපිළිවෙල අනුව "Y" තීරුව ගැලපූ විට නිවැරදි වරණය වන්නේ,
1. D,A,E,C,B
2. D,C,E,A,B
3. C,B,E,A,D
4. B,A,D,C,E
5. A,C,D,B,E (..........)

8) පහත ව්‍යාපාර නාම දෙක පිළිබඳව අවධානය යොමු කරන්න.
A. සම්පත් වැල්ලගිරිය සහ සමාගම
B. සීමා සහිත උදානී පොදු සමාගම
ඉහත ව්‍යාපාර නාම හා බැඳුනු සාවද්‍ය ප්‍රකාශය වන්නේ,
1. A ව්‍යාපාර සංවිධානය සේවල ස්වාමී ව්‍යාපාරයකි.
2. B ව්‍යාපාර සංවිධානය කොටස් වෙළඳපොලේ ලැයිස්තුගතව ඇත.
3. A හා B යන ව්‍යාපාර සංවිධාන දෙකටම නෛතික පුද්ගලභාවය පවතී.
4. A ව්‍යාපාර සංවිධානය අසීමිත වගකීමකින් යුතු අතර B ව්‍යාපාර සංවිධානය අඛණ්ඩ පැවැත්මකින් යුක්ත වේ.
5. A ව්‍යාපාර සංවිධානය ලියා පදිංචිය සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත අයදුම්පත් ඉදිරිපත් කල යුතුය. (..........)

9) ව්‍යවසායකයකු ව්‍යවසායකත්වය සඳහා ආකර්ෂණයට ඉවහල් නොවන සාධකයක් වන්නේ,
1. තම අභිමතය පරිදි කටයුතු මෙහෙයවීමේ අපේක්ෂාව
2. තම හැකියාවන් තමා වෙනුවෙන් යොදවා ගැනීමේ අවශ්‍යතාවය
3. විවිධත්වයට ඇති කැමැත්ත
4. සිය ව්‍යාපාරයේ ප්‍රධානියා තමාම වීමේ අපේක්ෂාව
5. ආරක්ෂාකාරී කටයුතු කිරීමේ අපේක්ෂාව (..........)

10) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා උපදේශන සේවා සපයන ආයතනයක් නොවන්නේ,
1. කාර්මික සංවර්ධන මණ්ඩලය
2. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය
3. ජාතික ඇසුරුම් මධ්‍යස්ථානය
4. ව්‍යවසායක ප්‍රාග්ධන සමාගම්
3. අපනයන සංවර්ධන මණ්ඩල (..........)



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

11) ශ්‍රී ලංකාවේ මහ බැංකුවේ ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේ බලතල ඇති සමාන්තර ආයතන දෙක වන්නේ,
1. පාලක මණ්ඩලය හා සුරැකුම්පත් මණ්ඩලය
2. පාලක මණ්ඩලය හා මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය
3. විනිමය පාලන මණ්ඩලය හා සුරැකුම්පත් මණ්ඩලය
4. පාලක මණ්ඩලය හා ණය කළමණාකරණ මණ්ඩලය
5. සුරැකුම්පත් මණ්ඩලය හා මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය (..........)

12) ගෙවීම් උපකරණ සම්බන්ධ පහත ප්‍රකාශයන්ගෙන් වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ,
1. කාසි හා නෝට්ටු මෙන්ම චෙක්පත් ද පූර්ණ ද්‍රවශීලතාවයකින් යුක්ත වේ.
2. හරපත් , ගනුදෙනුව සිදුවන මොහොතේම මුදල් හුවමාරු වීමේ පදනම මත ක්‍රියාත්මක නොවේ.
3. චෙක්පත් අගරු කරනුයේ ගෙවන බැංකුකරු විසිනි.
4. ස්වයංක්‍රීය ටෙලර් කාඩ්පත විද්‍යුත් මුදලක් ලෙස සලකයි.
5. ණයපත් වාණිජ බැංකු වෙතින් පමණක් පිරිනමනු ලබයි. (..........)

13) ජීවිත ආරක්ෂණය,
1. නියත අවදානමක් මත. පදනම වේ.
2. සිදු වූ හානියට සරිලන වන්දියක් ලබාදීම හා බැඳේ.
3. පැවරිය හැකි රක්ෂණ ආවරණයකි.
4. එක් පුද්ගලයෙකුට එක් ආවරණයක් පමණක් ලබාගත හැකි වන්නකි.
5. තමා කැමති ඕනෑම අගයකට ලබා ගැනීමේ අවකාශය නොමැත. (..........)

14) සන්නිවේදන පද්ධතියක මූලිකාංගයක් ලෙස නොසැලකෙන්නේ,
1. මාධ්‍ය 2. යවන්නා 3.පණිවිඩය
4. ප්‍රතිපෝෂණය 5. ශබ්දය (..........)

15) "X" තීරුවේ ප්‍රවාහන ක්‍රමයක ගුණාංග හා " Y" තීරුවේ අදාල ප්‍රවාහන ක්‍රම ද දැක්වේ.

| X | Y |
|---|---|
| 1. ධාරිතාව | A. නල මාර්ග |
| 2. සුලභතාවය | B. දුම්රිය මාර්ග |
| 3. සුරක්ෂිත බව | C. මහා මාර්ග |
| 4. ප්‍රවේශ වීම | D. ගුවන් මාර්ග |

X තීරුවේ අනුපිළිවෙල හා Y තීරුව ගැලපූ විට නිවැරදි වරණය වන්නේ,
1.B,D,C,A 2. A,C,D,B 3. B,C,A,D 4.C,A,D,B 5.D,C,B,A
(..........)

16) ප්‍රවාහන හා සැපයුම් සේවාවන්ගේ ප්‍රයෝජනයක් නොවන්නේ,
1. පිරිවැය අවම වීමයි.
2. ගුණත්වය ආරක්ෂා වීම.
3. තරඟකාරිත්වයට මුහුණ දිය හැකි වීම.
4. අක්‍රිය පිරිවැය දැරීමට සිදුවීම.
5. අපද්‍රව්‍ය කළමනාකරණය පහසු වීම. (..........)

17) වෙළඳසැල් රහිත සිල්ලර වෙළඳාම සිදුවන ආකාර දෙක වන්නේ,
1. විද්‍යුත් සිල්ලර වෙළඳාම සහ සෘජු අලෙවිකරණය
2. ස්වයංක්‍රීය විකිණුම් යන්ත්‍ර සහ සෘජු අලෙවිකරණය
3. විද්‍යුත් වාණිජ්‍යය හා විද්‍යුත් ව්‍යාපාර
4. විද්‍යුත් සිල්ලර වෙළඳාම හා ස්වයංක්‍රීය විකුණුම් යන්ත්‍රය
5. ඉහත කිසිවක් නොවේ. (..........)


iexamhub www.iexamhub.com Your Trusted Partner for Exam Success Past Papers Model Answers • Study Resources

18) සංවිධානකරණ මූලධර්ම හා සම්බන්ධ සාවද්‍ය ප්‍රකාශය කුමක්ද?
1. එක් කළමණාකරුවෙකුට සෘජුව වාර්තාකරනු ලබන සහායකයින් සංඛ්‍යාව පාලන අවකාශයයි.
2. එක් සේවකයෙකු ඔහුට ඉහළින් සිටින එක් කළමණාකරු වෙත පමණක් වගකීමට බැඳීම විධාන ඒකීයතාවයයි.
3. සංවිධාන ධුරාවලියේ ඉහළ සිට පහළට ඇති නිවැරදි සම්බන්ධතාව අනුව අධිකාරය ගලා යා යුතුය.
4. විධාන ඒකීයතාවය යටතේ එක් ප්‍රධානියෙකු වෙත වාර්තාකළ යුත්තේ එක් සහායකයෙකු පමණි.
5. පටු පාලන අවකාශයක් තුලින් උස් සංවිධාන ව්‍යුහයක් නිර්මාණය වේ. (..........)

19) නායකත්වය පිළිබඳ පහත ප්‍රකාශන දෙක කෙරෙහි අවධානය යොමුකරන්න.
A. කිසියම් පුද්ගලයෙකුගේ හෝ කණ්ඩායමක චර්යාව කෙරෙහි බලපෑම් කිරීමට ඇති හැකියාව නායකත්වයයි.
B. නායකත්වයේ අත්‍යවශ්‍යම අංගය බලයයි.
ඉහත ප්‍රකාශන දෙක සම්බන්ධව වඩාත් නිවැරදි ඉදිරිපත් කිරීම වන්නේ,

1. A පමණක් නිවැරදි වේ
2. B පමණක් නිවැරදි වේ
3. A නිවැරදි වන අතර B වැරදි වේ
4. B නිවැරදි වන අතර A වැරදි වේ.
5. A හා B යන දෙකම නිවැරදි වේ. (..........)

20) තොග පිරිවැය සම්බන්ධ වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ,
1. ස්ථාවර හා විචල්‍ය යනුවෙන් කොටස් දෙකකින් සමන්විත වේ.
2. ඇණවුම් පිරිවැය හා පවත්වාගෙන යෑමේ පිරිවැය ලෙස කොටස් දෙකකින් සමන්විත වේ.
3. සෘජු පිරිවැය හා වක්‍ර පිරිවැය ලෙස කොටස් දෙකකින් සමන්විත වේ.
4. ද්‍රව්‍ය එහා මෙහා කිරීමේ වියදම් ඇණවුම් පිරිවැයට අයත් වේ.
5. ආනයන තීරු බදු, තොග පවත්වාගෙන යෑමේ පිරිවැයට අයත් වේ. (..........)

21) නිර්මාණයට හා නිෂ්පාදනයට පරිගණක තාක්ෂණය යොදා ගැනීමට අදාල තාක්ෂණික ශිල්පක්‍රමය වන්නේ,
1.CAM 2. CAD 3. CIM 4. CNC 5. CBM
(..........)

22) නිෂ්පාදිතයක ජීවන චක්‍රයට අනුව අලාභ මට්ටමේ පැවතිය යැයි අපේක්ෂිත අදියර දෙක වන්නේ,
1.හඳුන්වාදීම හා පරිනතිය 2. සංවර්ධනය හා හඳුන්වාදීම 3. පරිනතිය හා පරිහානිය
4. සංවර්ධනය හා පරිහානිය 5. වර්ධනය හා පරිනතිය
(..........)

23) අලෙවිකරන දර්ශනයන් සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වන්නේ ,
1. විකුණුම් සංකල්පයේදී විකුණුම් පරිමාව තුලින් ලාභ ලැබීම අපේක්ෂා කරයි.
2. ඉල්ලුම පැහැදිලිව විද්‍යාමානවීම නිෂ්පාදන සංකල්පයේදී වැදගත් නොවේ.
3. ගනුදෙනුකරු සංකල්පයේදී ඉලක්ක වෙළෙඳපල ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා හා වුවමනා අවධානයට ගනියි.
4. අලෙවිකරන සංකල්පය ක්‍රිසාධක සංකල්පය ලෙස හඳුන්වයි.
5. සමාජ වගකීම් අලෙවිකරණය නිෂ්පාදිත සංකල්පයේ මූලිකාංගයකි. (..........)


iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

24) X තීරුවේ මූල්‍ය උපකරණද Y තීරුවේ ඒවායෙහි ලක්ෂණද දැක්වේ.

| X මූල්‍ය උපකරණ | Y ලක්ෂණ |
|---|---|
| 1. සාමාන්‍ය කොටස් | A පොලියක් හිමිවේ. |
| 2. ණයකර | B උපරිම කල්පිරීමේ කාලය වසර එකකි. |
| 3. වාණිජ පත්‍රිකා | C මධ්‍ය හා දිගුකාලීන ණය උපකරණයකි. |
| 4. භාණ්ඩාගාර බිල්පත් | D ස්ථිර ලාභාංශ හිමි නොවේ. |
| 5. භාණ්ඩාගාර බැඳුම්කර | E මුදල් වෙළඳපල තුල හුවමාරු වේ. |

මූල්‍ය උපකරණ වල අනුපිළිවෙල අනුව ලක්ෂණ ගැලපූ විට නිවැරදි වරණය වන්නේ,

1. A ,E,B,C,D 2. D,A,E,B,C 3. E,B,D,A,C 4. B,A,C,D,E 5. C,B,A,D,E (..........)

25) කෙටිකාලීන ආයෝජන තීරණ යටතට ගැනෙන්නේ,
1. ණයගැතියන් සම්බන්ධ තීරණ
2. ණයගැනීම සම්බන්ධ තීරණ
3. දේපළ පිරියත උපකරණ මිලදීගැනීම සම්බන්ධ තීරණ
4. ලාභාංශ සම්බන්ධ තීරණ
5. ණයහිමියන් සම්බන්ධ තීරණ (..........)

26) සේවක අර්ථසාධක අරමුදල (EPF) හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල(ETF) සඳහා අවම සේවා සේවක දායකත්ව ප්‍රතිශත නිවැරදිව දැක්වෙන

| | සේවක අර්ථසාධක අරමුදල EPF | සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල ETF |
|---|---|---|
| 1 | සේවා 10% සේවක 15% | සේවා 5% |
| 2 | සේවා 12% සේවක 8 % | සේවා 3% |
| 3 | සේවා 15% සේවක 10% | සේවක 5% |
| 4 | සේවා 12% සේවක 8 % | සේවක 3% |
| 5 | සේවා 8 % සේවක 12 % | සේවක 3% |

(..........)

27) සේවක දුක්ගැනවිලි නොවිසඳීමේ ප්‍රතිවිපාකයකි.
1. සේවක පිරිවැටුම අඩු වීම. 2. සේවක ප්‍රවාසිතාව අඩුවීම.
3. වෘත්තීය ක්‍රියාමාර්ග අවම වීම. 4. කාර්මික සම්බන්ධතා වර්ධනය වීම.
5. කාර්මික සාමය බිඳ වැටීම. (..........)

28) තොරතුරු වර්ගීකරන නිර්නායක හා තොරතුරු වර්ග නිවැරදිව දැක්වෙන කාණ්ඩය වන්නේ,
1. ස්වභාවය - බාහිර / අභ්‍යන්තර 2. කළමණාකරන ශ්‍රිත - ප්‍රමාණාත්මක / ගුණාත්මක
3. කළමනාකරණ මට්ටම - උපක්‍රමික / උපායමාර්ගික 4. මූලාශ්‍රය - අතීත / වර්තමාන (..........)
5. කාලය - නියත / සම්භාවිතාත්මක

29) පහත වගුවේ දැක්වෙන්නේ තොරතුරු පද්ධති හා ඒවායේ ලක්ෂණයන්ය.

| තොරතුරු පද්ධතිය | ලක්ෂණ |
|---|---|
| 1. විධායක උපකාරක පද්ධතිය(ESS) | A ගනුදෙනු හා සිද්ධීන් යෙදවුම් වේ. |
| 2. තීරණ ආධාරක පද්ධතිය(DSS) | B ලිපිලේඛන නිමැවුම් වේ. |
| 3. කාර්යාල ස්වයංක්‍රිය පද්ධතිය(OAS) | C දැනුම් සේවකයින් විසින් භාවිත කරයි. |
| 4. දැනුම් කාර්ය පද්ධති (KWS) | D සංකීර්ණ අවස්ථාවල යොදා ගනියි. |
| 5. ගනුදෙනු සැකසුම් පද්ධති(TPS) | E අර්ධ ව්‍යුහයාත්මක තීරණගැනීමට යොදා ගනියි. |


iexamhub www.iexamhub.com Your Trusted Partner for Exam Success Past Papers Model Answers • Study Resources

තොරතුරු පද්ධතිවල අනුපිළිවෙල අනුව ලක්ෂණ ගැලපූවිට ලැබෙන පිළිතුරු වන්නේ,

1. D,E,B,C,A 2. B,E,D,C,A 3. A,D,B,C,E 4. C,A,B,D,E 5. E,A,B,C,D

(..........)

30) මෙහෙයුම් සැලැස්මක අන්තර්ගත කරුණක් නොවන්නේ,

1. අමුද්‍රව්‍ය අවශ්‍යතා 2. කරගකාරිත්වය විශ්ලේෂණය 3. පිරියත සැලැස්ම
4. මෙහෙයුම් පෙර වියදම් 5. සේවක අවශ්‍යතා

(..........)

- අංක 31 සිට 40 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමේදී සුදුසු වචනය/ වචන යොදා හිස්තැන් පුරවන්න.

31) ගනුදෙනුකරුවන් තුල පවතින තෘප්තිමත් නොවූ ........................ ..........තුලින් ....................................නිර්මාණය වන අතර ඒවාට.................................... ලෙස නිෂ්පාදිත පිලිවද ............................ව්‍යවසායකයින් විසින් ඉදිරිපත් කරනු ලබයි.

32) අ) වාණිජ බැංකු සඳහා ........................ ..............පනත යටතේ බලපත්‍ර පිරිනමන අතර මූල්‍ය සමාගම් සඳහා ...................................පනත යටතේ බලපත්‍ර පිරිනමයි.

ආ) 2023 අංක 16 දරණ ශ්‍රී ලංකා මහ බැංකු පනතට අනුව ............................................සාක්ෂාත් කර ගැනීම සහ ............................ .....................මහබැංකුවේ ප්‍රධාන අරමුණ වේ.

33) අ) ගනුදෙනුයකට අදාලව ගැණුම්කරු හා විකුණුම්කරු සම්මුඛ කරමින් ඊට පහසුකම් සැලසීම ........................................... විසින් සිදුකරන අතර විවෘතව හා වාචිකව ඉහළ මිලගනන් ඉදිරිපත්කරන්නවුන්ට ප්‍රධානියාගේ භාණ්ඩ අලෙවි කිරීම ..........................................විසින් සිදුකරයි.

ආ)විදේශ වෙළඳාමේදී බහුල ලෙස භාවිතාවන මිල ප්‍රකාශකිරීමේ ක්‍රමය........................ ...............වන අතර ඒතුල............................ , ...................................... , ..................................ඇතුලත් වේ.

34) අ) කල යුතු කාර්යයන් හඳුනාගැනීම ........................ ..........අදාල කාර්යයක් වන අතර විචලනයන් හඳුනා ගැනීම............................ ................අදාල කාර්යයක් වේ.

ආ)තීරණාත්මක හා වැදගත් කාර්යයන් හැර අන් සියළු කාර්යයන් සංවිධාන ධුරාවලියේ පහළ මට්ටම් වලට පැවරිය යුතු බව .......................................................මූලධර්මයෙන් අදහස්වන අතර එය අධිකාරය...........................................................මඟපෙන්වයි.

35) අ) ද්‍රව්‍ය ඇණවුම්කර ඒවා ගබඩාවට ලැබෙන තෙක් ගතවන කාලය........................................................... වන අතර ගබඩාවේ තොග උපරිම මට්ටමේ සිට අවම මට්ටම දක්වා පත්වීමට ගතවන කාලය ................................................................වේ.

අ)කුසලතා සහිත පුහුණු සේවකයින් සෑම විටම අවශ්‍ය වීම ..................................................නිෂ්පාදනයේ අහිතකර ලක්ෂණයක් වන අතර නවීන තාක්ෂණය පහසුවෙන් යොදාගත හැකි වීම .............................................. නිෂ්පාදනයේ හිතකර ලක්ෂණයකි.

36) අ) අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍යයන් අතරින්........................ඉක්මනින් වෙනස්කල හැකි විචල්‍ය ලෙස සැලකෙන අතර අලෙවිකරන සන්නිවේදන උපාංගයන්ගෙන්.............................. සමන්විත වේ.

ආ)............................ නිහඩ විකුණුම්කරුවකු ලෙස සැලකෙන අතර අනාගත විකුණුම් වර්ධනය........................තුලින් අපේක්ෂා කරයි.

37) අ) අනාගත ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහයන් ඇසුරින් ..........................පිලියෙල කරන අතර අතීත සත්‍ය මුදල් ප්‍රවාහයන් ඇසුරින් ..................................පිලියෙල කරයි.

ආ)මූල්‍ය අතරමැදියන් සම්බන්ධ කර නොගෙන අවශ්‍ය අරමුදල් සපයා ගැනීම ................................වන අතර විනිමය බිල්පත් ...............................වෙළඳපල තුල ගනුදෙනුවන මූල්‍ය උපකරණයකි.

38) අ) .................................................................හා ...................................................................වෘත්තීය සමිති පිහිටුවාගත නොහැකි සේවාදායකයින් ලෙස සැලකේ.



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

ආ).................................ණයකියා ගිවිසුමක් ඇති වූ බවට ලැබෙන ලිඛිත සාක්ශියක් සේ සැලකෙන අතර ..........................ලිපියක් භාරදීමෙන් අයදුම්කරු...................................බවට පත්වේ.

39) අ)දත්ත පුවිශේෂී පිලිවෙලකට සැකසීම.................................වන අතර ඒවායින් යම් අදහසක් ඇතිකර ගත හැකි ආකාරයට කැටිකර දැක්වීම ................................................ වේ.

ආ)ප්‍රචාරණ හා ප්‍රවර්ධන වැඩසටහන් දියත් කිරීමට අදාල තොරතුරු.................................හරහා සපයන අතර .................................... හරහා මූල්‍ය අනුපාත විශ්ලේෂණයට අදාල තොරතුරු සපයයි.

40) අ)ඇස්තමේන්තුගත පිරිවැය,.........................................යනාදියෙහි දැක්වෙන තොරතුරු වල සාරාංශගත ලේඛනය.................................................හදුන්වයි.

ආ)බාහිර පාර්ශව තවදුරටත්.............................. පිලිබදව සොයාබැලීමට පෙළඹවීම............................ මූලික පරමාර්ථයයි.

❖ අංක 41 සිට 50 තෙක් ප්‍රශ්න වලට සුදුසු පිලිතුරු දී ඇති හිස්තැන් මත ලියන්න.

41) ව්‍යාපාර සමාජ වගකීම් ඉටුකිරීමට පවතින බාධක හතරක් නම් කරන්න.

....................................................................................................................
....................................................................................................................
....................................................................................................................
....................................................................................................................

42) රාජ්‍ය සංස්ථාවික පාලනය සිදුවන ආකාර හතර සඳහන් කරන්න.

....................................................................................................................
....................................................................................................................
....................................................................................................................
....................................................................................................................

43) ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන්සභාවේ කාර්යයන් හතරක් දක්වන්න.

....................................................................................................................
....................................................................................................................
....................................................................................................................
....................................................................................................................

44) පහත එක් එක් කෙටි යෙදුම්වල දීර්ග අදහස ලියා දක්වන්න.

1. CSR ..........................................................................................................
2. TRC...........................................................................................................
3. CRN ..........................................................................................................
4. CRIB .........................................................................................................

45) සංවිධානයක සිරස් සන්නිවේදනය සිදුවන අවස්ථා හතරක් නම්කරන්න.

....................................................................................................................
....................................................................................................................
....................................................................................................................
....................................................................................................................

46) හුවමාරුවක් සම්පූර්ණවීම සඳහා ඉටුවියයුතු කොන්දේසි හතරක් සඳහන් කරන්න.

....................................................................................................................
....................................................................................................................
....................................................................................................................
....................................................................................................................



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

47) කොළඹ කොටස් හුවමාරුව ශ්‍රී ලංකා ආර්ථිකයට වැදගත්වීමට හේතු හතරක් දක්වන්න.

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

48) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන කම්කරු අණපනත් අනුව පහත කරුණු හා බැඳුණු විධිවිධාන දක්වන්න.

| කරුණ | |
|---|---|
| 1 කාර්යාල සේවකයින්ගේ දෛනික සේවාකාලය (කෑම පැය හැර) | ............................................. |
| 2 සේවා දායකයකු ලෙස සේවයේ යෙදවිය හැකි අවම වයස | ............................................. |
| 3 දරු ප්‍රසූතියකදී හිමි සම්පූර්ණ වැටුප් සහිත නිවාඩු දින ගණන | ............................................. |
| 4 සාමාන්‍ය තත්ත්වය යටතේ වෛද්‍ය වාර්තා ඉදිරිපත් කිරීමකින් තොරව අඛණ්ඩව නිවාඩු ලබා ගත හැකි දින ගණන | ............................................. |

49) පුද්ගලයෙකුගේ එදිනෙදා කටයුතු සඳහා අන්තර්ජාලය මගින් ලබාගත හැකි පහසුකම් හතරක් නම් කරන්න.

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

50) ව්‍යාපාරයක මෙහෙයුම් පෙර වියදම් හතරක් සඳහන් කරන්න.

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

***



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

සියලු ම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது/ All Rights Reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

# අ.පො.ස (උ.පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2025

| ව්‍යාපාර අධ්‍යයනය II | 32 | S | II | 13 ශ්‍රේණිය | පැය තුනයි |
|---|---|---|---|---|---|

උපදෙස්:
* අමතර කියවීමේ කාලය මිනිත්තු 10 යි.
* අමතර කියවීමේ කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.
* එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න 02 බැගින් තෝරා ගෙන ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

## 1 කොටස

1. වෘත්තියෙන් ගුරුවරියක වූ තමාලි මහත්මිය ගුරුසේවයෙන් නියමිත කලට පෙර විශ්‍රාම යැමෙන් අනතුරුව පිය දියණියන් දෙදෙනාගේ අධ්‍යාපන කටයුතු මෙන්ම ගේදොර වැඩකටයුතුවල නිරතවෙමින් කාලය ගත කළාය..

කුඩාකල සිට තමා වඩාත් ඇලුම්කල ආහාර පිසීම,මැහුම් ගෙතුම් කටයුතු,මල් වගාව,විසිතුරු නිර්මාණ යනාදිය සිදුකිරීමට ඇයට බොහෝ නිදහසක් රැකියාවෙන් විශ්‍රාම යැමෙන් පසු උදා විය.

දියණියන්ගේ උපන්දින උත්සව,පාසලේ විශේෂ අවස්ථා , ඥාතීන් හා හිතවතුන්ගේ ප්‍රිය සම්භාෂණ සඳහා කිසිදු මුදල් අයකිරීමක් නොරව කේක් නිෂ්පාදනය කර දීමට ඇය කටයුතු කළ අතර එම නිෂ්පාදන ප්‍රනීත රසයකින් හා ඉහළ ගුණත්වයෙන් යුක්තව සිදුකිරීමට ඇය වග බලාගන්නා ලදී.

ඇයගේ ස්වාමිපුරුෂයා වන සමන්ත මහතා වෘත්තියෙන් ගුරුවරයක් වන අතර ඔහුද මෙම කටයුතු සඳහා නොමඳ සහයක් ලබා දෙයි.සමන්ත මහතාගේ අදහස වන්නේ මෙම කේක් නිෂ්පාදන ව්‍යාපාරය යැපුම්ම වටමෙන් ඔබ්බට ගෙන ගොස් සාර්ථක ව්‍යාපාරයක් බවට පත්කරගතහොත් ඉහල ප්‍රතිලාභ අත්කරගත හැකි බවයි.

ඒ අනුව ඒ සඳහා අවශ්‍ය ප්‍රාග්ධනය,උපකරණ,අමුද්‍රව්‍ය ඇතුළු යෙදවුම්ද , සැපයුම්කරුවන් , අතරමැදි වෙළදුන් වැනි පාර්ශවද, සමාජ මාධ්‍ය, කටින්කට ලැබෙන ප්‍රචාරණයන් තුලින්ද වර්තමානය වන විට සාර්ථක ව්‍යාපාරයක් දියත්කිරීමට ඔවුනු සමත්ව සිටිති.

1) අ) ඉහත සිද්ධියෙන් අනාවරණය වන නිෂ්පාදිතය ස්පර්ශභාවය අනුව කවරකට අයත් වන්නේද? (ලකුණු 01)

ආ)එම නිෂ්පාදිතය තුල ඔබ දකින සුවිශේෂී ලක්ෂ දෙකක් නම් කරන්න. (ලකුණු 01)

ඇ)කේක් නිෂ්පාදන ව්‍යාපාරයේ යෙදවුම් නිමැවුම් ක්‍රියාවලිය රූපසටහනට නගන්න. (ලකුණු 02)

2) අ)කේක් නිෂ්පාදන ව්‍යාපාරය හා සැබදි අභ්‍යන්තර පරිසර සාධක දෙකක් හා ආසන්න පරිසර සාධක දෙකක් සිද්ධිය ඇසුරින් දක්වන්න. (ලකුණු 02)

ආ)මෙම සිද්ධිය ඇසුරින් පහත ව්‍යාපාර කටයුතු පැහැදිලි කරන්න.

1. අවශ්‍යතා හා උවමනා සපුරාලීම
2. සම්පත් වලට අගය එකතු කිරීම (ලකුණු 02)

3) අ)පිය ව්‍යාපාරයේ සාර්ථකත්වයට තමාලි මහත්මියගේ ක්‍රියාකලාපය ඉවහල්වන ආකාර දෙකක් නම්කර විස්තර කරන්න. (ලකුණු 02)

ආ)යම් ආර්ථික කටයුත්තක් යැපුම් මට්ටමේ සිට ව්‍යාපාරික මට්ටමට පත්කර ගැනීමේදී මුහුණපෑමට සිදුවන අභියෝග මොනවාද? (ලකුණු 02)



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources
iexamhub

4) අ)ව්‍යාපාර කටයුතු වලදී කමාලි මහත්මිය අනුගමනය කරනු ඇතැයි ඔබ සිතන ආචාරධර්ම දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ආ)ව්‍යාපාර කටයුතු වලදී සමාජ වගකීම් ඉටු කිරීමේ වැදගත්කම පිළිබඳ ඔබ කමාලි මහත්මියට මඟපෙන්වීමක් සිදුකරන්නේ කෙසේද? (ලකුණු 02)

5) කමාලි මහත්මිය පිය කේක් නිෂ්පාදන සඳහා ඇසුරුමක් හා ලේබලයක් නිර්මාණය කර ඇති අතර එහි වැදගත් තොරතුරු ගණනාවක් සඳහන්ව ඇත ඔබ සිතන ආකාරයට එම තොරතුරු මොනවාද?ඒ එක් එක් තොරතුර පාරිභෝගික ආරක්ෂාවට ඉවහල්වන අයුරු වෙන් වෙන් වශයෙන් විස්තර කරන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 20)

2. ප්‍රදේශයේ පැවැත්වෙන අවුරුදු උත්සවයක පූර්ව ප්‍රචාරණ කටයුතු සඳහා ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතාකරන්නනේ නම් ඒ සඳහා අවසර ලබාගත යුතුබව පොලිස් ස්ථානයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු විසින් එහි සංවිධායකයින් වෙත දන්වා ඇත.

1) අ)ඝෝෂාකාරී ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතය තුලින් උල්ලංඝනයවන පාර්භෝගික අයිතිවාසිකම කුමක්ද? එය ඉදිරිපත් කරන ලද්දේ කවුරුන් විසින්ද? (ලකුණු 02)

ආ)පාරිභෝගික ආරක්ෂණය වෙනුවෙන් කටයුතු කරන රාජ්‍ය ආයතන හතරක් නම් කරන්න (ලකුණු 02)

2) අ)තේවල ස්වාමි ව්‍යාපාරයකට අනන්‍ය ලක්ෂණ හතරක් නම් කරන්න. (ලකුණු 02)

ආ)හවුල් ව්‍යාපාරයක බංකොලොත් වූ හවුල්කරුගේ ණය ප්‍රමාණය සම්බන්ධයෙන් සෙසු හවුල්කරුවන් ක්‍රියාකල යුත්තේ කෙසේද? (ලකුණු 02)

3) අ)සමාගමක කොටසක් යනු කුමක්ද? (ලකුණු 02)

ආ)කොටසක නිකුතු අගය පිලිබද සමාගම් පනතෙහි දැක්වෙන විධිවිධානය කුමක්ද? (ලකුණු 02)

4) අ)වරලත් ව්‍යාපාර ක්‍රමයෙන් වරලත් හිමියාට හා වරලත් ලාභියාට අත්වන වාසි දෙක බැගින් ලියන්න (ලකුණු 02)

ආ)රාජ්‍ය ව්‍යවසායන් පෞද්ගලීකරණය කිරීම තුලින් අත්වන ආර්ථික හා සමාජීය ප්‍රතිලාභ මොනවාද?(ලකුණු 02)

5) අ)ව්‍යවසායකත්ව ක්‍රියාවලියේ පළමු පියවර වන නව්‍යතා සොයාගැනීම යන්නෙන් කුමක් අදහස් වේද? (ලකුණු 02)

ආ)"ව්‍යවසායකත්ව සංස්කෘතිය"යනු කුමක්ද?එවැන්නක් නිර්මාණය වීමේ අවශ්‍යතාවය දක්වන්න (ලකුණු 02) (මුළු ලකුණු 20 )

3. 1) අ)ස්වයං රැකියා ව්‍යාපාරයක් යනු කුමක්ද? (ලකුණු 02)

ආ)ශ්‍රී ලංකාව වැනි රටකට ස්වයං රැකියා ව්‍යාපාර ව්‍යාප්තවීමේ වැදගත්කම දක්වන්න (ලකුණු 02)

2) ලංකා බැංකුවෙහි ජංගම ගිණුම් හිමියෙකු වන සාගර 2025 09 25 වන දින චන්දන ජයසිංහ නම් ඔහුගේ මිතුරෙකු වෙත රු.50,000 ක විධාන චෙක්පත් ලියා ඊට , චන්දනගේ බැංකු ගිණුම හරහා පමණක් මුදල් කරගත හැකිවන පරිදි සාමාන්‍ය රේඛණයක්ද යොදා ලදී

ඉහත තොරතුරු සැලකිල්ලට ගෙන සාගර විසින් චන්දන වෙත පිරිනමන ලද චෙක්පතෙහි ආකෘතියක් ඇද දක්වන්න. (ලකුණු 04)

3) අ)කොටස් හුවමාරු සමාගම්වෙත බලපත්‍ර පිරිනමනු ලබන ආයතනය කුමක්ද? (ලකුණු 02)

ආ)කොටස් හුවමාරු සමාගම් සමාගම් වල කාර්යයන් හතරක් නම් කරන්න. (ලකුණු 02)

4) අ)අගරු චෙක්පත් නිවේදනයක සඳහන් නැවත ඉදිරිපත් කල හැකි අවස්ථාවන් හිදී සංකේත හා නැවත ඉදිරිපත් කල නොහැකි අවස්ථාවන් හිදී සංකේත හතර බැගින් දක්වන්න. (ලකුණු 02)

ආ)මූල්‍ය කල්බදු හා මෙහෙයුම් කල්බදු අතර සැසඳීමක් කරන්න (ලකුණු 02)



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

5) අ)වගකීම් සංරක්ෂණය යනු කුමක්ද? (ලකුණු 02)
ආ)වගකීම් රක්ෂණය යටතේ ලබාගතහැකි වගකීම් රක්ෂණ ඔප්පු වර්ග හතරක් නම්කරන්න.(ලකුණු 02)
(මුළු ලකුණු 20 )

4. 1) අ)විද්‍යුත් සන්නිවේදන ක්‍රම හතරක් නම් කරන්න (ලකුණු 02)
ආ)විද්‍යුත් සන්නිවේදන ක්‍රම තුල හඳුනාගත හැකි සුවිශේෂී ලක්ෂණ කවරේද? (ලකුණු 02)
2) අ)සමාජීය කටයුතු සඳහා සන්නිවේදනය වැදගත් වන ආකාර හතරක් දක්වන්න. (ලකුණු 02)
ආ)සඵලදායී සන්නිවේදනයක තිබිය යුතු ගුණාංග හතරක් නම් කරන්න. (ලකුණු 02)
3) ශ්‍රී ලංකාවේ ප්‍රවාහන පද්ධතියේ සංවර්ධනය උදෙසා රජය මෑතකදී ගෙන ඇති ක්‍රියාමාර්ග නිදසුන් සහිතව විස්තර කරන්න. (ලකුණු 04)
4) අ)අන්‍යෝන්‍ය තීරුබදු(Reciprocal Tariffs)යනු මොනවාද? (ලකුණු 02)
ආ)ශ්‍රී ලංකාවේ අපනයන සඳහා ඇමරිකා එක්සත් ජනපදය අන්‍යෝන්‍ය තීරු බදු පැනවීමෙන් ඉහළ තීරුබද්දකට ශ්‍රී ලංකාවේ අපනයන ලක්වීම නිසා ශ්‍රී ලංකා ආර්ථිකයට ඇති වන අහිතකර බලපෑම් හතරක් නම්කරන්න. (ලකුණු 02)
5) අ)ජාත්‍යන්තර මූල්‍ය අරමුදල(IMF)යනු කුමක්ද? (ලකුණු 02)
ආ) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල පිහිටුවීමේ අරමුණු හතරක් නම් කරන්න (ලකුණු 02)
(මුළු ලකුණු 20 )

## II කොටස

5. 1) සැලසුම්කරණය හා සෙසු කළමණාකරණ කාර්යයන් අතර පවතින අන්‍යෝන්‍ය සබඳතාව විස්තර කරන්න. (ලකුණු 04)
2) අ)සංවිධානයකට නායකත්වය වැදගත්වන්නේ මක් නිසාද? (ලකුණු 02)
ආ)නායකයා සහ කළමණාකරු අතර සැසඳීමක් කරන්න. (ලකුණු 02)
3) අ)පාලන ක්‍රියාවලියේ පියවර නම් කරන්න (ලකුණු 02)
ආ)පාලන ක්‍රියාවලියේ වැදගත්කම විස්තර කරන්න. (ලකුණු 02)
4) අ)කර්මාන්ත ශාලාවක ධාරිතාවය යනු කුමක්ද? (ලකුණු 02)
ආ)ප්‍රමාණවත් ධාරිතාවක් නොමැතිවීමේ අහිතකර ප්‍රතිවිපාක මොනවාද? (ලකුණු 02)
5) අ)ආර්ථික ඇණවුම් ප්‍රමාණය(EOQ) යනු කුමක්ද? (ලකුණු 02)
ආ)එක්තරා තොග අයිතමයක් සඳහා වන වාර්ෂික ඉල්ලුම ඒකක 5000කි.එක් ඇණවුමක් සඳහා වන පිරිවැය රු.80 වන අතර ඒකකයක රඳවා ගැනීමේ පිරිවැය වසරකට රු.5 කි.ආර්ථික ඇණවුම් ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 02)
(මුළු ලකුණු 20 )

6. 1) අ)තොග පාලන ක්‍රම හතරක් නම් කරන්න (ලකුණු 02)
ආ)ව්‍යාපාරයක් සඳහා මනා තොග පාලනයක අවශ්‍යතාවය පැහැදිලි කරන්න. (ලකුණු 02)
2) අ)ඩිජිටල් අලෙවිකරණය ( Digital Marketing ) යන්න හඳුන්වන්න. (ලකුණු 02)
ආ)ඩිජිටල් අලෙවිකරණය තුලින් ව්‍යාපාරයකට අත්වන ප්‍රතිලාභ මොනවාද? (ලකුණු 02)
3) අ)සන්නාම පක්ෂපාතිත්වය යනු කුමක්ද? (ලකුණු 02)
ආ)සන්නාම පක්ෂපාතිත්වයේ වට්ටම් නම් කර පැහැදිලි කරන්න. (ලකුණු 02)
4) අ)අලෙවිකරණ සන්නිවේදන මිශ්‍රය යනු කුමක්ද? (ලකුණු 02)
ආ)මහජන සම්බන්ධතා සහ ප්‍රසිද්ධිය හඳුන්වා ඒ සඳහා ව්‍යාපාර විසින් අනුගමනය කරනු ලබන දෑ මොනවාද? (ලකුණු 02)
5) අ)ප්‍රධාන මූල්‍ය කළමණාකරන තීරණ දෙක උ.දා.සහිතව විස්තර කරන්න. (ලකුණු 02)
ආ)අභ්‍යන්තර හා බාහිර මූල්‍ය සම්පාදන මාර්ග අතර සැසඳීමක් කරන්න. (ලකුණු 02)
(මුළු ලකුණු 20 )



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

7. 1) රුක්මිලාගේ ව්‍යාපාරයේ මූල්‍ය ප්‍රකාශන වලින් 2025.03.31 දිනට පහත ශේෂයන් උපුටා ගන්නා ලදී.

- සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය රු.15000
- සංචිත රු. 5000
- 14% ණයකර රු.30000

2025.03.31 දිනෙන් අවසන් වර්ෂයේ බදු පසු ශුද්ධ ලාභය රු.25000ක් වූ අතර ඉන් රු.10000ක් සංචිත සඳහා වෙන් කර ඉතිරිය කොටස් හිමියන් සඳහා ලාභාංශ ලෙස බෙදා හැරීමට තීරණය කරන ලදී.

අ)මෙම ව්‍යාපාරයේ කවර ප්‍රාග්ධන තෝලන තත්ත්වයක් පවතීද ඒවැනි තත්ත්වයකට තුඩු දිය හැකි හේතු කවරේද? (ලකුණු 02)

ආ)මෙම ව්‍යාපාරය සඳහා අතිරේක ප්‍රාග්ධනය සම්පාදනයේදී ණයකර පමණක් නිකුත් කල යුතු බවට සාමාන්‍ය කොටස් හිමියන් තරයේ කියා සිටී නම් ඊට හේතුව කුමක් විය හැකිද?

(ලකුණු 02)

2). අ)කොළඹ කොටස් හුවමාරුවේ ගනුදෙනු වන පුරුකුම්පත් හතරක් නම් කරන්න. (ලකුණු 02)

